## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# එකතුකළ අගය මත බද්ද

### 2017 ජූනි මාසය සඳහා ගෙවීම් කිරීම සහ වාර්තාව සැපයීම 2017 ජූනි 30 න් අවසන් වන කාර්තුව සහ අර්ධ වර්ෂය සඳහා අවසන් ගෙවීම කිරීම සහ වාර්ෘතව සැපයීම

<table>
<tr><td>

**ගෙවීම්**

❖ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාව තුල නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්ම සැපයීම සිදු කරනු ලබන විටදී එකතුකළ අගය මත බද්ද ගෙවිය යුතු අවසාන දිනය

</td><td>2017.07.20</td></tr>
<tr><td>

❖ අනෙකුත් තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාර (ඉහත සදහන් තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාර හෝ මූල්‍ය සේවාවන් සපයන තැනැත්තන්ගේ එකී මූල්‍ය සේවාවන් සම්බන්ධයෙන් වන එකතුකළ අගය මත බද්ද වන තාක් දුරට, හැර) 2017 ජූනි මස 16 සිට 30 දින දක්වාවූ කාලසීමාව සඳහා ගෙවීම් කළ යුතු අවසාන දිනය

**(2017 ජූලි මස 15 වන දින සෙනසුරාදා දිනයක් බැවින්, 2017 ජූලි මස 14 වන දින හෝ ඊට පෙර ගෙවීම් කිරීමට කටයුතු යොදන මෙන් කාරුණිකව දන්වමි.)**

</td><td>2017.07.15</td></tr>
<tr><td>

(2017 ජූලි මස 1 සිට 15 දින දක්වාවූ කාලසීමාව සඳහා 2017.07.31 දින හෝ ඊට පෙර ගෙවීම් කළ යුතුය)

❖ - **2017 දෙසැම්බර් 31** දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා වාර්ෂික ගිණුම් පිළියෙල කරනු ලබන මූල්‍ය සේවා සපයන තැනැත්තන් විසින් 2017.06.30 දිනෙන් අවසන් වන මාස 06 ක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය සේවාවන් මත එකතුකළ අගය මත බද්දේ **අවසන් මාසික වාරිකය** හෝ

- **2018 මාර්තු 31** දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා වාර්ෂික ගිණුම් පිළියෙල කරනු ලබන මූල්‍ය සේවා සපයන තැනැත්තන් විසින් 2017.09.30 දිනෙන් අවසන් වන මාස 06 ක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය සේවාවන් මත එකතුකළ අගය මත බද්දේ **තෙවන මාසික වාරිකය**

**ගෙවිය යුතු අවසාන දිනය**

</td><td>2017.07.20</td></tr>
<tr><td>

**වාර්තා**

එකතුකළ අගය මත බදු වාර්තා මාසිකව, කාර්තුමය හෝ අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරන බදු ගෙවන්නන් වාර්තා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය

</td><td>2017.07.31</td></tr>
</table>

**සටහන :**

➢ යම් අදාළ බදු ඉන්වොයිසියක් හෝ රේගු ප්‍රකාශනයක් සම්බන්ධයෙන් එකතු කළ අගය මත යෙදවුම් බදු බැර (එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන වලට යටත්ව), නිමැවුම් බද්දෙන් 100% ක් දක්වා පමණක් අඩු කළ හැකිය.

**නියමිත දිනයන්ට හෝ ඉන් පෙර එකතු කළ අගය මත බද්ද ගෙවීම් නොකිරීම සම්බන්ධයෙන් වන දණ්ඩන මුදල් එසේ ගෙවීම් සිදු නොකිරීම යම් විශේෂිත හේතූන් නිසා සිදුවූවක් බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේනම්ද අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්තිසහගත වන්නේනම්ද මිසක අත්හැරීමක් හෝ අඩු කිරීමක් නොකරන බවට දන්වමි.**

**ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීම් කළ හැකිය.**

**කරුණාකර චෙක්පතේ පිටුපස බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) හා බදු කාල සීමාව සඳහන් කරන්න.**

**එකතු කළ අගය මත බදු සඳහා ගෙවීම් කිරීමේ දී ඔබ විසින් නව ගෙවීම් පත්‍රිකා භාවිතා කළයුතු අතර, එහි දී පහත සඳහන් ගෙවීම් කේතයන් ඊට අදාළ කාලසීමාවන් සඳහා නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන්න.**

| කාලසීමාව | | ගෙවිය යුතු දිනය | ගෙවීම් කේතය |
|---|---|---|---|
| 16/06/2017 | 30/06/2017 | 15/07/2017 | 17232 |
| 1/06/2017 | 30/06/2017 | 20/07/2017 | 17230 |
| 1/07/2017 | 15/07/2017 | 31/07/2017 | 17311 |

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් ද්වාරය - **www.ird.gov.lk**

කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**